**AIA Insurance Lanka PLC** (Co. No. PQ 18)
Head Office
P O Box 2088
75, Kumaran Ratnam Road,
Colombo 2, Sri Lanka
T : (+94 11) 231 0310
F : (+94 11) 244 7620
E : lk.info@aia.com
AIALIFE.COM.LK

Media Release

# AIA ඉන්ෂුවරන්ස්, දශක දෙකක් තිස්සේ අධ්‍යාපනික විශිෂ්ටත්වය දිරිගන්වයි

''අධ්‍යාපනය මගින් ජනතාව නායකත්වය දීමට හා පාලනය කිරීමට පහසු පුද්ගලයින් බවට පත් කරනු ලබන අතරම එමගින් ඔවුන් වහල් බවට පත් කරගැනීමේ හැකියාව දුරු කරයි'' යනුවෙන් පසුගියදා පැවති 14වැනි AIA උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව ප්‍රදානෝත්සවයේ ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් සහභාගී වූ සම්මාන මහාචාර්ය කුසුමා කරුණාරත්න සිය දේශනයේදී පැවසුවාය. ඇය මේ බව ප්‍රකාශ කලේ 2007 පහ වසර ශිෂ්‍යත්ව විභාගයේදී දිස්ත්‍රික්ක 25 හි ඉහළම ලකුණු ලබාගෙන විශිෂ්ට දක්ෂතා දක්වන ලද සිසු සිසුවියන් අමතමිනි. එවකට 11 හැවිරිදි වියෙහි පසුවූ මෙම සිසු සිසුවියන් මෙම වසරේදී උසස් පෙළ ප්‍රවේශය ලබන අතර ඔවුහු AIA ඉන්ෂුවරන්ස් මගින් ප්‍රදානය කරනු ලබන උසස් අධ්‍යාපන ශිෂ්‍යත්වයන්හි ප්‍රතිලාභ ලබාගැනීම සඳහා සුදුසුකම් ලබති.

මහාචාර්ය කුසුමා කරුණාරත්න සිංහල භාෂාව සම්බන්ධ පළමු මහාචාර්යවරිය වශයෙන් ගෞරවයට පාත්‍ර වන අතර, ඇය ශ්‍රී ලංකා සිංහල සාහිත්‍ය ක්ෂේත්‍රයෙහි උන්නතිය උදෙසා කැපී පෙනෙන භූමිකාවක් නිරූපනය කරන්නීය. ඇය මොරටුව විශ්ව විද්‍යාලයේ උපකුලපති ධූරයද හෙබවූවාය. කොළඹ විශ්ව විද්‍යාලයෙන් විශ්‍රාම ලබන විට ඇය සිංහල සම්බන්ධ ජ්‍යෙෂ්ට මහාචාර්යවරිය වශයෙන් කටයුතු කළ අතර ඉන් අනතුරුව ඇය සම්මාන මහාචාර්ය පදවියෙන් පිදුම් ලැබුවාය. ඇය විසින් ඉටුකරන ලද මෙහෙවර වෙනුවෙන් මහාචාර්ය කුසුමා කරුණාරත්න අවස්ථා රැසකදී සම්මානයට පාත්‍ර වූ අතර ජපාන අධිරාජ්‍යයා විසින් පුරවැසියකු වෙත පිරිනමනු ලබන උසස්ම සම්මානය වන 'The order of the rising sun' සම්මානයද ඒ අතර වේ.

මෙහිදී 5 වසර ශිෂ්‍යත්වයේදී දිවයිනේ සෑම දිස්ත්‍රික්කයකම පළමු ස්ථානයට පත් සිසු සිසුවියන් වෙත උසස් පෙළට ඇතුළත් වීමේ සිට සිය සරසවි අධ්‍යාපන කටයුතු නිම කරන තෙක් මාසික ශිෂ්‍යාධාරයක් හිමි වේ. ඔවුන් විශ්ව විද්‍යාලය වෙත ඇතුළත් වීමට අදහස් නොකරන්නේ නම් AIA ඉන්ෂුවරන්ස් මගින් සිය වෘත්තීය දිවිය ඇරඹීම සඳහා රු.50,000 ක මුදලක් එකවර ලබාදෙනු ලැබේ.

5 වසර ශිෂ්‍යත්ව විභාගයේදී විශිෂ්ට දක්ෂතා දක්වන්නා වූ ජාතියේ කුසලතාපූර්ණ දූ දරුවන්ගේ අධ්‍යාපනික විශිෂ්ටත්වය දිරිගැන්වීම උදෙසා AIA ඉන්ෂුවරන්ස් මගින් වසර 1994 සිට මෙම උසස් අධ්‍යාපනික ශිෂ්‍යත්ව ප්‍රදානය සිදු කෙරේ. මෙම උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව ප්‍රදානයෙහි විශේෂත්වය වනුයේ හුදෙක් අධ්‍යාපනික විශිෂ්ටතවය පමණක් පදනම් කරගනිමින් කොන්දේසි විරහිතව සිසුන් හට ප්‍රතිලාභ සැලසීමයි. එහිදී සමාගම සමග ජීවිත රක්ෂණවරයක් පැවතීම හෝ එවැනි වෙනත් කිසිදු අවශ්‍යතාවයක් සපුරාලීම අවශ්‍ය නොවේ.

සිය අදහස් දැක්වීම සඳහා සිසුනට ආරාධනා කෙරුනු අවස්ථාවේදී රැස්ව සිටි පිරිස ඇමතීම සඳහා සිසුන් දෙදෙනෙකු ඉදිරිපත් වූහ. ''විවිධ පසුබිම් වල ජීවත් වන දක්ෂතා සපිරි උපකාර අවශ්‍ය සිසුන් රැසක් දිවයින පුරා විසිරී සිටිනවා. එහිදී AIA මගින් සිදු කරනු ලබන මෙම සද්කාර්යය අනාගතය සාර්ථක කරගැනීම සඳහා අප හට ප්‍රබල පිටුවහලක් වෙනවා.'' යනුවෙන් අනුරාධපුර සිට පැමිණි ප්‍රවර්ධි බණ්ඩාර සිසුවිය පැවසුවාය. රත්නපුර සිට පැමිණි කාවින්ද කුලරත්න සමාගම වෙත මෙසේ සිය ප්‍රණාමය පුද කලේය. ''මෙම ශිෂ්‍යත්වය සිසුන් හට සිය අනාගත අපේක්ෂාවන් සපුරාගැනීම සඳහා බෙහෙවින් ආධාර වන අතර එය සැබෑ ජීවිතය හඳුනන රක්ෂණ සමාගම වන AIA මගින් දියත් කරනු ලබන ප්‍රශංසනීය ව්‍යාපෘතියක් වශයෙන් දැක්විය හැකියි.''

වසර 20ක කාලයක් පුරා මෙසේ ප්‍රදානය කරන ලද ශිෂ්‍යත්ව සංඛ්‍යාව 500 ඉක්මවා වර්ධනය වී ඇත. මේ යටතේ ශිෂ්‍යත්ව ප්‍රතිලාභ ලද සිසුන් සංඛ්‍යාව මේ වන විට 350 කි. මේ සඳහා 1994 දී රුපියල් මිලියන 10 ක් යොදවමින් පිහිටුවන ලද අරමුදල මනා ආයෝජනයන් හේතුවෙන් මේ වන විට හය ගුණයකින් වර්ධනය වී ඇත.

''AIA උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව යනු ජාතියේ කුසලතාපූර්ණ දූ දරුවන් අධ්‍යාපනය කෙරෙහි දිරිගැන්වීම සඳහා දියත් කරන ලද ඉතාමත් වැදගත් ආයතනික සමාජ වගකීම් ව්‍යාපෘතියක් වශයෙන් දැක්විය හැකියි. අපගේ දරුවන් අධ්‍යාපනික විශිෂ්ටත්වය අත්පත්කරගැනීම කෙරෙහි දිරිගන්වමින් දේශය වඩාත් ඉහළ තලයකට ඔසවා තැබිය හැකි අනාගත නායකයින් බිහි කිරීමට මෙසේ දායක වීමට ලැබීම අප හට ඉමහත් අභිමානයට කරුණක් බව පැවසිය යුතුයි'' යනුයෙන් සමාගමෙහි අලෙවි ප්‍රධානි සුරේන් පෙරේරා පැවසීය.

සමාප්තයි.


**Media Enquiries:**
**Suren Perera, Head of Marketing & Company Spokesman**
**Office – 2310028, Mobile – 0773 457 959 concise**